# චයිනමන්: සමාලෝචනය

චයිනමන් - ප්‍රදීප් මැතිව්ගේ ක්‍රිකට් ප්‍රවාදය මෙතෙක් ශ්‍රී ලංකාවෙන් බිහි වූයේ යැයි සැලකෙන විශිෂ්ටතම ටෙස්ට් ක්‍රීඩකයා පිළිබඳ කතාවය. නමුත් ඔහු සිය දස්කම්වලින් ඉහලම හිණි පෙත්තට නොයා අකාලයේ මැකී යයි.

මෙය අර්ධ ශෝකාන්තයක් මෙන්ම සුඛාන්තයක්ද වේ. එක් අතකට අභිරහසකි. බීමත් මිනිසකුගේ විකල් මතක සටහන් පෙළක් යැයිද කිව හැකිය. 1999 ශ්‍රී ලංකාව ඊට පසුබිම් වේ. ලෝක කුසලානය දිනූ උණුසුමත් තවත් අවුරුදු දහයක් දික් ගැසෙන යුද්ධයත් ඒ වන විටද පවතී. කොළඹ පාරවල්, ක්‍රිකට් තරඟ, අමුතු ගෙවල් හා අප්‍රකට තැබෑරුම් අතර සිදුවීම් පෙළ ගැසේ.

කතාව කියන්නේ සිය 64 වසරක ජීවිතය ක්‍රිකට් හා මධුවිතෙහි දිය කළ විශ්‍රාමික, ක්‍රීඩා වාර්තාකරු ඩබ්ලිව්. ජී. කරුණාසේනය. තම අක්මාවේ බරපතළ තත්ත්වය වෛද්‍යවරුන් විසින් හෙළි කරනු ලැබීමෙන් පසු ඩබ්ලිව්. ජී, එතෙක් සියැසින් දුටු ආශ්චර්යමත්ම දේ නොහොත් ප්‍රදීප් මැතිව් නම් 80 ගණන්වල විශ්වකර්ම වමත් දඟ පන්දු යවන්නා සොයා යන්නට තීරණය කරයි.

නමුත් මැතිව් 1995දී, ශ්‍රී ලංකාව ලෝක කුසලානය දිනාගන්නට මාස ගණනකට පෙරාතුව අතරුදහන් වී ඇත. ඔහු ගැන මතක ප්‍රේක්ෂකයන්, හිටපු ක්‍රීඩකයන්, විස්තර විචාරකයන් හා පුහුණුකරුවන් සමග කතා බහ කිරීමෙන් මැතිව් ඕනෑම ඉරියව්වක් අනුකරණය කරමින් දෑතින්ම පන්දු යැවිය හැකි, පුංචි පහේ ක්‍රිකට් සරදියෙල් කෙනකු බව ඩබ්ලිව්. ජී. ට වැටහේ.

බොහෝ දෙනකුට මතක මැතිව්ගේ ඉන්ද්‍රජාලික පන්දු සහ සංඛ්‍යාත්මක වාර්තාය. තවත් කෙනකු සිහිපත් කරන්නේ ඔහුගේ උද්දච්චකම හා කම්මැලිකමයි. මැතිව් මුදලට තරඟ පාවාදුන් බව සමහරුන් පවසද්දී දෙමළ ජාතිකයකු වීම නිසා කප්පාදුවට ලක්වුණු බවයි ඇතැමුන් කියන්නේ.

ඩබ්ලිව්. ජී. ට තමුන්ගේ සෞඛ්‍යය හා පුත්‍රයා ගැන ද ප්‍රශ්න පැන නගී. සිය දක්ෂකම්වලින් ඵලක් ගන්නට නොහැකිවීමත් මැතිව්ගේ ඉරණමත් අතර කිසියම් සමානකමක් ඔහුට පෙනේ. අන්තිමේ මැතිව් සිටින තැනකින් සොයාගෙන ඔහුගේ අතුරුදහන් වීමට හේතු පැහැදිලි කර ගැනීම ඩබ්ලිව්. ජී. ගේ ජීවිතාසාව බවට පත් වන්නේය.

මේ සෙවිල්ල ඔහුව අසාමාන්‍ය පුද්ගලයන් හා අත්භූත තැන් වෙත කැඳවාගෙන යයි. සුප්‍රකට ක්‍රීඩාංගනයක් යට ඇති සුද්දන්ගෙ කාලේ බන්කරයක් ගැනද, ඩී. ඊ. කූගරාජා නමැති තරඟ පාවා දීම් සහ ඝාතන සංවිධානකරුවකුගේ අප්‍රකට බංගලාවක් ගැනද ඔහුට හෙළිදරව් වේ. ඩබ්ලිව්. ජී. ජීවිතේ ගැනත්, සියරට හා තමුන් ගැනත් බොහෝ සත්‍යයන් වටහා ගන්නේ මේ ගමනේදීය.

චයිනමන් හාස්‍යමය-රහස් පරීක්ෂක කතාවක් කීවාට වරදක් නැති. එසේත් නැතිනම් බොහෝ සම්පත් තිබුණත් ඒවා නැති නාස්ති කර ගැනීමේ අපූරු හැකියාවකින් හෙබි අපේ රට ගැන සංකේතාත්මක ප්‍රබන්ධයක් කියන්නටද පුළුවන.